හක්මණ ප්‍රාදේශීය සභාව,
මාතර දිස්ත්‍රික්කය.
-------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 25 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට හක්මණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂවල කර්මාන්ත 16 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.1,887,447 ක ණයහිමියන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ණයහිමියන් නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂයේ මිලට ගෙන තිබූ එකතුව රු.1,952,529 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ප්‍රාග්ධනිත කළ යුතුවේ. | ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර ගැනීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී කාබනික පොහොර නිෂ්පාදන අංගනය ඉදිකිරීමට මිලදීගත් ඉඩමේ වටිනාකම සහ කොම්පෝස්ට් අංගනයේ ඉදිකිරීම් සඳහා වැයවූ රු.9,324,508 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ප්‍රාග්ධනිත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැති ශේෂය රු.5,658,218 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ණයගැතියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී රු.350,042 ක් ගිණුම්ගත කර නොතිබුණි. | පොලී ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී ගැළපීම් කිරීමට කටයුතු කරමි. |
| (vi) | සමාලෝචිත වර්ෂය අවසානයට විවිධ තොග ශේෂය රු.69,675 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | විවිධ තොග ශේෂයන්හි එකතුව රු.69,582 වැඩියෙන් ගිණුම්ගත කිරීම නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (vii) | සමාලෝචිත වර්ෂය අවසානයට කාබනික පොහොර නිෂ්පාදන අංගනය ඉදිකිරීම සඳහා මිලදීගත් ඉඩම සඳහා ගෙවිය යුතු රු. 1,500,000 ක් වෙනුවෙන් ණය හිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 ගිණුම් සැකසීමේදී සිදුවී ඇති වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.40,363,835 ක් වූ ගිණුම් විෂයයන් 14 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.3,386,968 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.873,211 ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන ගිණුම්වලට ගැලපීමට සමාලෝචිත වර්ෂයේදීද පියවර ගෙන නොතිබුණි. | ඒ පිළිබඳව සොයාබලා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### (ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.17,985,988 ක් වූ ගිණුම් විෂයයන් 23 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | වසර 07ක පමණ කාලයක සිට නොවෙනස්ව පවතින අගයන් වන අතර උපයෝගී ලේඛන ඉදිරියේදී සොයාගෙන හැකිතාක් දුරට නිරවුල් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) රීති 143 | ආපසු ගෙවිය යුතු තැන්පත් ලෙජරය මාසිකව එකතු කර ශේෂයේ එකතුව ප්‍රධාන ලෙජර ගිණුම සමඟ ගැලපීම් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී රීති 143 අනුව කටයුතු කරමි. |
| (ii) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (iii) රීති 213 | ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කිරීමේදී සභා ලේකම්ගේ අනුමැතිය ලබා නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කිරීමේදී සභා ලේකම්ගේ අනුමැතිය |

| | | | |
|---|---|---|---|
| | | | ලබාගැනීමට කටයුතු කරමි. |
| (ආ) 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | භාවිතයෙන් ඉවත් කර තිබූ වාහන 06 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී එම තක්සේරු වාර්තා අනුව වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.6,586,757 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.6,773,619 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් පවත්වාගෙන ගොස් තිබූ එක් බැංකු ජංගම ගිණුමක වසර ගණනාවකට පෙර අවස්ථා අටකදී තැන්පත් කරන ලද රු.15,910 ක් වූ චෙක්පත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උපලබ්ධි වී නොතිබුණි. | අගරු චෙක්පත්වලට අදාල මුදල් කඩිනමින් අයකරගත යුතුවේ. | ඉදිරියේදී නිරවුල් කරමි. |

**2.3** **ආදායම් පරිපාලනය**

**2.3.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,531,100 | 1,621,679 | 1,386,345 | 1,333,927 | 1,032,500 | 1,579,059 | 1,416,768 | 1,098,593 |
| කුලී | 7,625,305 | 7,375,441 | 5,875,399 | 1,994,052 | 6,078,586 | 5,973,118 | 5,846,340 | 494,010 |
| බලපත්‍ර ගාස්තු | 459,000 | 669,679 | 665,229 | 15,500 | 789,000 | 378,910 | 373,560 | 11,050 |
| වෙනත් ආදායම් | 6,440,000 | 5,712,437 | 7,822,375 | 11,926,790 | 8,023,550 | 11,270,260 | 7,831,657 | 14,036,728 |
| **එකතුව** | 16,055,405 | 15,379,236 | 15,749,348 | 15,270,269 | 15,923,636 | 19,201,347 | 15,468,325 | 15,640,381 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත මුළු ආදායම රු.16,055,405 ක් වූ අතර බිල්කල ආදායම රු.15,379,236 ක් විය. රු.15,640,381 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.31,019,617 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.15,749,348 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.15,270,269 ක් වී තිබුණි. අයවීම් ප්‍රගතිය සියයට 51 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

### 2.3.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වරිපනම්** | | |
| ආරම්භක හිඟය රු.832,863 ක් වූ අතර, රු.1,121,392 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.1,954,255 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.905,506 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.1,048,749 ක් හිඟව පැවතුණි. මුළු අයවීම්,ආරම්භක හිඟයෙන් හා බිල්කිරීම්වලින් සියයට 46 ක් තරම් පහළ මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉතිරි හිඟ මුදල අයකර ගැනීම සඳහා 2019 මැයි 27 දින සිට 2019 මැයි 31 දින දක්වා පුරා දින 05 ක් තුල ජංගම සේවයක් පැවැත්වීමට කටයුතු කර ඇති අතර ඉන්පසුව පවතින හිඟ මුදල සඳහා වරෙන්තු නිකුත් කිරීමට බලාපොරොත්තු වෙමි. |
| **(ආ) අක්කර බදු** | | |
| ආරම්භක හිඟය රු.47,200 ක් වූ අතර, බිල් කිරීම් රු.6,060 ක් සමග රු.53,260 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.9,770 ක් | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ අක්කර බදු ගෙවන ලෙස ලිඛිතව දන්වා ඇත. |

වූයෙන්, වර්ෂය අවසානයට රු.43,490 ක් හිඟව පැවතුණි. වර්ෂය තුළ මුළු අයවීම් ආරම්භක හිඟයෙන් හා බිල්කිරීම්වලින් සියයට 18 ක් තරම් පහළ මට්ටමක පැවතුණි.

**2.3.4 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) කඩකුලී** | | |
| ආරම්භක හිඟය රු.501,748 ක් වූ අතර, රු.3,950,050 ක් වූ බිල්කිරීම් සමග රු.4,451,798 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.2,450,008 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.2,001,790 ක් හිඟව පැවතුණි. වර්ෂය තුළ මුළු අයවීම්, ආරම්භක හිඟයෙන් හා බිල්කිරීම්වලින් සියයට 55 ක් තරම් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා 2019 මැයි මස සමථ මණ්ඩලය වෙත යොමුකර අයකර ගැනීමට කටයුතු කරගෙන යමි. |
| **(ආ) බිම් බදු** | | |
| ආරම්භක හිඟය රු.195,400 ක් වූ අතර, රු.112,000 ක් වූ බිල්කිරීම් සමග රු.307,400 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.92,000 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.215,400 ක් හිඟව පැවතුණි. මුළු අයවීම්, ආරම්භක හිඟයෙන් හා බිල්කිරීම්වලින් සියයට 30 ක් තරම් පහළ මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | මෙම මුදල් කාර්තු වශයෙන් අයකර ගැනීමට කටයුතු කරගෙන යමි. |

**2.3.5 ජල ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආරම්භක හිඟය රු.232,786 ක් වූ අතර වර්ෂයේ රු.1,793,045 ක බිල්කිරීම් සමඟ වර්ෂය තුළ රු.2,025,831 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂයේ මුළු අයවීම් රු.1,501,734 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.524,097 ක් හිඟව පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉතිරි හිඟ මුදල වන රු.175,791 ක මුදල ක්ෂේත්‍රයෙන් අයකර ගැනීම සඳහා රතු නිවේදන යැවූ අතර තවද ක්ෂේත්‍රයේ ගොස් එම මුදල අයකර ගැනීමට කටයුතු කරමි. |

## 2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ රු.2,314,709 ක් හා මුද්දර ගාස්තු රු.8,780,656 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබාදෙන ලෙස පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ඉල්ලීම් කරමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධන ඇගයීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම (Output ) ලබානොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේ පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ කුරුඳු පියස ජල ව්‍යාපෘතියෙන් ජලය සැපයීම සඳහා නල ළිං 02 ක් ඉදි කිරීමට රු.1,594,704 ක් ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ගෙවා තිබුණද, ජල මූලාශ්‍ර හඳුනා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වන විටත් අදාළ කාර්යය ඉටු වී නොතිබුණි. | ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනය නිසි පරිදි සිදුකළ යුතුවේ. | මෙම ව්‍යාපෘතිය සඳහා දැනට පවතින ජල ධාරිතාව ප්‍රමාණවත් නොවන බැවින් දැනට ජලය පොම්ප කරන ජල බුබුල කේන්ද්‍ර කරගෙන නළ ළිඳක් ඉදිකිරීමට ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට දන්වා |

| | | |
|---|---|---|
| | | ඇත. එයද අසාර්ථක වුවහොත් ජල සම්පාදන මණ්ඩලයට ගෙවා ඇති මුදල් නැවත ප්‍රාදේශීය සභාවට ලබාගැනීමට කඩිනමින් කටයුතු කරමි. |

(ආ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.9,324,508 ක් වැයකර 2018 අගෝස්තු 27 දින වැඩ අවසන් කර තිබූ කොම්පෝස්ට් අංගනයට අවශ්‍ය උපකරණ නොමැති වීමෙන් 2019 මැයි 10 දිනටද කොම්පෝස්ට් අංගනයේ වැඩ ආරම්භ කර නොතිබුණි. සභාව විසින් දෛනිකව එක්රැස් කරන කසළ වර්ග කිරීමකින් තොරව මිලදීගෙන තිබූ ඉඩමට අවිධිමත් ආකාරයට බැහැර කර පස්වලින් වැසීම සිදුකරමින් තිබුණි. | අංගනයට අවශ්‍ය උපකරන සපායාගෙන ව්‍යාපෘතියේ ප්‍රතිලාභ අත්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ගැටළු නිරාකරණය කල හැකි වූ වහාම වලවල් කපා කුණු පස් යටකර දැමීම නතර කරනු ලබන අතර කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සිදු කරමි. |

(ඇ) තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීම

-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකරගැනීමට වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කළ යුතුවේ. | දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොමැත. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 15 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 07 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අනුමත කිරීමට දෙපාර්තමේන්තුවට යවා ඇත. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | සභාව සතු දේපළ බදුදීම | | |
| (අ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/ 2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව කඩ කාමර සම්බන්ධව සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවද සභාව සතු කඩ කාමර 206 කින් 167 ක ගිවිසුම් කල් ඉකුත් වී තිබූ අතර එයින් කඩ කාමර 23ක ගිවිසුම් කාලය ඉකුත්වී වර්ෂ 10 ක් ඉක්මවා තිබුණි. කඩ කාමර 16ක් සම්බන්ධව ගිවිසුම්ගත වී නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව නොපමාව කටයුතු කළ යුතුවේ. | නව තක්සේරුව අනුව ගිවිසුම්ගත වී නොමැත. |
| (ආ) | ඉහත සඳහන් චක්‍රලේඛයේ 11 වන වගන්තිය ප්‍රකාරව සභාවේ අනුමැතියකින් තොරව අතුරු බදු දීම කිසිසේත් නොකළ යුතු බව දන්වා තිබුණද සභාව සතු කඩ කාමර 67 ක් බදුකරුවන් විසින් අතුරු බදු දී තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව නොපමාව කටයුතු කළ යුතුවේ. | නව තක්සේරුව අනුව ගිවිසුම්ගත වී නොමැත. |

## 3.4 වත්කම් කළමණාකරණය

### 3.4.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවට ලැබී තිබූ වටිනාකම රු.4,250,000 ක් වූ වාහන 04 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. | සභාවලට ලැබුණු වාහනවල අයිතිය පවරාගත යුතුවේ. | වාහන හක්මණ ප්‍රාදේශීය සභාව නමට පැවරීමට අවශ්‍ය කටයුතු සිදුකර වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

### 3.4.2 නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි | | |
| | සභාව සතු රු. 1,112,500 ක් වටිනා පැරණි ප්‍රාදේශීය සභා කාර්යාලය , මහජන පුස්තකාලය සහ ගරාජය නිෂ්ක්‍රීයව පැවතුණි. | නිශ්ක්‍රීයව පවතින වත්කම් ඵලදායී කාර්යයන් සඳහා යොදා ගත යුතුවේ. | ඉදිරියේදී එහි වෛද්‍ය සායන මධ්‍යස්ථානයක් ඇතිකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| (ආ) | මෝටර් රථ හා කරත්ත | | |
| | සභාව සතුව පැවැති රු.1,070,000 ක් වටිනා වාහන 06 ක් නිෂ්ක්‍රීයව පැවති අතර වාහන අළුත්වැඩියා කර ධාවනයට යොදවා ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඵලදායී කාර්යයක් සඳහා යොදාගැනීම හෝ ප්‍රයෝජනයට ගත නොහැකි නම් අපහරණ කටයුතු සිදු කළ යුතුවේ. | පවරා ගැනීම සිදු කළ වහාම මෙම වාහන 06ම අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ / ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වියදම් විෂයයන් 07 ක ඉතිරිවීම්වල එකතුව රු.7,824,032 ක් වූ අතර, එම අගයන් සියයට 10 සිට 446 දක්වා පරාසයක පැවතුණි. | තාත්වික වන පරිදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී පෙන්වා දී ඇති අහිතකර තත්වයන් යහපත් කරගැනීමට කටයුතු කරමි. |
| (ආ) ආදායම් විෂයයන් 03 ක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව රු.6,103,304ක් වූ අතර එම අගයන් සියයට 03 සිට 16 දක්වා පරාසයක පැවතුණි. | තාත්වික වන පරිදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී පෙන්වා දී ඇති අහිතකර තත්වයන් යහපත් කරගැනීමට කටයුතු කරමි. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 යන රෙගුලාසිවල දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපතිගෙන් විමසා නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ විධිවිධාන අනුව අභ්‍යන්තර විගණනය විධිමත් පරිදි ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 වර්ෂයට අදාල විගණන සැලැස්ම මේ වන විට සකස් කර ඇති අතර ඉදිරියේදී අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත්ද එවීමට කටයුතු කරමි. |